පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 5, අංක 6 2002 මැයි - ජූනි

# මඩ කුඹුරුවල වල් මර්ධනය සඳහා කොළ පොහොර

වී වගාවට පෝෂක ලබාදීම සඳහා බිම් සැකසීමේ අවස්ථාවේ දී කොළ පොහොර යෙදීම ඉපැරණි වගා ක්‍රමයකි. ග්ලිරිසීඩියා, වල් සූරියකාන්ත, කැප්පෙටියා මෙලෙස ගොවීන් භාවිතා කරන කොළ පොහොර ලබාදෙන ශාක විශේෂ කිහිපයකි.

කොළ පොහොර මගින් පසේ ඛනිජමය නයිට්‍රජන් ප්‍රමාණය වැඩි කරයි. බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් කරන ලද පර්යේෂණ වලට අනුව සමහර කොළ විශේෂ මගින් වී වගාකරන පහත් බිම්වල වල් ශාක වර්ධනය මැඩ පැවැත්වීම හෝ අඩු කරන බව හඳුනාගෙන ඇත. කැප්පෙටියා (ක්‍රොටොන් ලැසිෆෙරස්) සහ වල් සූරියකාන්ත (ටයිතෝනියා ඩයිවර්සිෆෝලියා) බීජ වැපිරීමට පෙර කොළ පොහොරක් ලෙස කුඹුරට යෙදීමෙන් වල් මැඩ පැවැත්වීමට හෝ වර්ධනය අඩු කිරීමට හැකි ශාක ලෙස හඳුනාගෙන ඇත.

නිර්දේශිත රසායනික පොහොර පමණක් යෙදූ ක්ෂේත්‍රයන් සමඟ සංසන්දනය කළ නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණයට අමතරව කොළ පොහොර යෙදූ කුඹුරක වල් වර්ධනය 50% කින් අඩු බව සොයාගෙන ඇත. මේ නිසා රසායනික පොහොර පමණක් යෙදූ කුඹුරට වඩා 23-27% ක අස්වනු වැඩිවීමක් කොළ පොහොර යෙදූ ක්ෂේත්‍රවල දැකිය හැකිය. කැප්පෙටියා, වල් සූරිකාන්ත මගින් වල් වර්ධනය අඩු කිරීම නිසා ලබාදෙන අස්වනු වැඩිවීම ග්ලිරිසීඩියා සහ බහුලව භාවිතාවන පිදුරු භාවිතයේදීට වඩා වැඩිවේ.

*මූලාශ්‍රය: **ඒ.එස්.කේ. අබේසේකර මිය, පර්යේෂණ නිලධාරිනී, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ.***

# මඩට වී වපුරන කුඹුරු වලට ග්ලයිපොසේට් හෝ පැරකොට් යෙදීමෙන් සිදුවන දීර්ඝකාලීන බලපෑම

ඉචෙනි ග්ලෝබෝසා, පැනිකම් රිපෙන්ස්, සයිපරස් විශේෂ, කොමෙලිනා ඩිෆියුසා සහ මර්ඩෙනියා නුඩිෆ්ලෝරා බහුල වශයෙන් පහත් බිම් වී වගාවේ දක්නට ලැබෙන වල් ශාක වේ. මෙම බහුවාර්ෂික වල් ශාක මර්ධනය කිරීම සඳහා සී සෑම, බිම් පෙරලීම හා මට්ටම් කිරීමට පෙර ග්ලයිපොසේට් හෝ පැරකොට් වැනි බීජ වැපිරීමට පෙර භාවිතා කරන වල්නාශක ක්ෂේත්‍රයට යොදයි. සමහරෙක් ගොවීන් වල්නාශක භාවිතා නොකර දෙවරක් සී සෑම කර පෝරු ගා මට්ටම් කර වී වගා කරයි.

බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් මෙවැනි ක්‍රියා කාරකම් වල් මර්ධනයේ කාර්යක්ෂමතාවයට දිගුකාලීන බලපෑම සහ වී අස්වැන්නට බලපෑම අධ්‍යයනය සඳහා පර්යේෂණ පවත්වන ලදී. මේ සඳහා පිඑච් අගය 6.2 ක් වූ ලෝහියුමික් ග්ලේ, වැලි ලෝම වයනය සහිත කුඹුරු පස භාවිතා විය. එහි කාබනික ද්‍රව්‍ය ප්‍රතිශතය 2.8% ක් විය.

ග්ලයිපොසේට් භාවිතය මගින් ක්‍රමයෙන් ක්ෂේත්‍රයේ දක්නට ලැබූ වල් ගහනයේ බර අඩුවිය. බහුවාර්ෂික වල් ශාක ජෛව ස්කන්ධය අඩුවීම 1996 වසරේදී, වල්නාශක නොයෙදූ ක්ෂේත්‍රයට වඩා 30% ක් වූ අතර 1998 වසර වන විට එය 80% ක් විය. පැරකොට් යෙදීම තුළින්ද වල්නාශක ජෛව ස්කන්ධය අඩු වූ නමුත් අඩුවීම ග්ලයිපොසේට් භාවිතා කළ ක්ෂේත්‍ර වලට වඩා අඩු විය. මෙම වල්නාශක වර්ග දෙකම වී ශාකයේ බාහිරව පෙන්නුම්කරන විෂවීමක් නොපෙන්වීය.

ග්ලයිපොසේට් යෙදීම හා දෙවරක් සී සෑම ජෛවමිතිකව සමාන ප්‍රතිඵල හා ඉහලම ධාන්‍ය අස්වැන්නක් පෙන්වීය. පැරකොට් යෙදූ සහ පැළ සිටුවීමට පෙර වල් නාශක නොයෙදූ ක්‍රම වලදී නිපදවූ ධාන්‍ය අස්වැන්න අඩු සහ එම පිළිවෙලට අඩුවෙමින් පවතින බව පෙන්විය.

ග්ලයිපොසේට් හෝ පැරකොට් වල්නාශක වල් මර්ධනය සඳහා, සිටුවීමට පෙර ක්ෂේත්‍රයට යෙදීම මගින් පහත්බිම් වී වගාවට කිසිදු ආකාරයේ හානිකර තත්ව ඇති නොකරයි.

පැරකොට් යෙදීමත්, අඩු බිම් සැකසීමත් මගින් බිම් සැකසීම සඳහා, ගතවන කාල සීමාව අඩු කළ හැකි අතර වල් මර්ධන වේගය වැඩි කළ හැකිය. කෙසේ නමුත් අධික වල් ගහනයක් සහිත බහුවාර්ෂික වල් පැළෑටි සහිත ක්ෂේත්‍රයක වල් ගහනය අඩු කිරීම ප්‍රධාන අරමුණ වන්නේ නම් ග්ලයිපොසේට් වඩා හොඳ තේරීම වේ.

*මූලාශ්‍රය: **ඒ.එස්.කේ. අබේසේකර, පර්යේෂණ නිලධාරිනී, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ.***

# කෘෂි සායන-ව්‍යාප්ති ක්‍රමයක් ලෙස

සායන යන වචනයත් සමග අපට සිහියට නැගෙනුයේ පුද්ගලයින් රාශියක් සඳහා පවත්වනු ලබන සෞඛ්‍යය වෛද්‍ය සායන පිළිබඳ මතයයි. එවැනි වෛද්‍ය සායන වලට බොහෝ දුරට සමාන කෘෂි සායන රාශියක් මහනුවර දිස්ත්‍රික්කයේ අන්තර් පළාත් ප්‍රදේශ වන නාඋල හා හඟුරන්කෙත ප්‍රදේශවල 2001/2002 මහ කන්නයේදී පවත්වන ලදී. මෙම සංකල්පය කෘෂි ව්‍යාප්තියේදී යොදා ගත් මුල් අවස්ථාව එය විය.

මෙම කෘෂි සායන පැහැදිලිව භූ විද්‍යාත්මකව වෙන්වූ ප්‍රදේශයක ගොවීන් සඳහා යොදා ගන්නා ලදී. පළමුව ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් එම ක්ෂේත්‍රවල පවතින ගැටළු හඳුනා ගැනීම සඳහා ඉතා හොඳ ක්ෂේත්‍ර අධ්‍යයනයක් කළයුතු වේ. දෙවනුව දිනයක් සැලසුම්කර ගැටළු සඳහා විසඳුම් ලබා දිය හැකි විශේෂඥ වරුන් සම්පත්දායකයින් ලෙස කැඳවිය යුතුය. අවශ්‍යනම් පර්යේෂණ අංශවල සහය ලබාගත හැකිය. තෝරාගත් ප්‍රදේශයේ ගොවීන්ට දිනය, ස්ථානය, වේලාව පිළිබඳව ඉතා හොඳ ප්‍රචාරයක් ලබා දිය යුතුය. ගැටළු ඉදිරිපත් කිරීමට, නිදර්ශක සමග පැමිණීමට ගොවීන් උනන්දු කළ යුතුය.

ක්ෂේත්‍රයේ ගැටළු බොහෝ සෙයින් පවතින කාලසීමාවක හෝ එවැනි ගැටළු සහගත ක්ෂේත්‍රවල මෙම සායන පැවැත්විය යුතුය. කෘෂිකර්මාන්තයට සම්බන්ධ වෙනත් ආයතන හා සංවිධාන වලටද ඇරයුම් කළ හැකි අතර වෙළෙඳපොල අලෙවි ගැටළු, පශුසම්පත් ගැටළු වැනි ගොවීන් විසින් මුහුණදෙන වෙනත් ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට ඉඩ සැලැස්වීම ඉතා උචිත වේ.

සායනය පැවැත්වෙන දිනයෙහි ගොවීන් ලියාපදිංචි කර ඔවුන්ගේ ගැටළු සුදුසු නිලධාරීන් වෙත යොමු කළ යුතුය. ගැටළුවට අදාළව ගෙනෙන ලද සාම්පලය ප්‍රමාණවත් නොවන විට හෝ ඒ පිළිබඳ විස්තර ප්‍රමාණවත් ලෙස නොමැති විට, විශේෂඥවරුන්ට ගොවීන් සමග එම ක්ෂේත්‍රයෙට ගොස් ගැටළු අධ්‍යයනය කිරීමට වාහන පහසුකම් සැලැස්වීම වඩාත් ප්‍රතිඵලදායක වේ.

එදිනම කෘෂිකර්ම චිත්‍රපට හා වීඩියෝපටි මගින් කෘෂිකාර්මික නව තාක්ෂණය ගොවීන්ට ලබාදීමට කටයුතු කළ හැකිවේ. බීජ, රෝපණ ද්‍රව්‍ය, පොහොර ගොවීන්ට අවශ්‍ය යෙදවුම් හා කෘෂිකාර්මික ප්‍රකාශන ලබා ගැනීමේ පහසුකම් ඇතිකළ යුතුය. පහසුකම් තිබේනම් ගොවීනට සංග්‍රහ කිරීම උචිතය.

## කෘෂි සායන වල වාසි

- කෙටි කාලයක් තුළ ක්ෂේත්‍රය තුල පවතින ගැටළු විශාල සංඛ්‍යාවක් සඳහා විසඳුම් ලබාදීමට හැකිවීම,
- ගොවීන්ගේ සමාජ ආර්ථික තත්වය සැලකිල්ලට ගෙන විසඳුම් ලබා දීම.
- එකම ස්ථානයකදී තනි, කණ්ඩායම් හා ජන සංනිවේදන ව්‍යාප්ති ක්‍රම තුලින් සාර්ථක ලෙස දැනුම හා හුරුව ලබාදීම.
- සෑම ගොවියෙකුගේම ගැටළු විවෘතව සාකච්ඡා වෙන බැවින් ගොවීනට ක්ෂේත්‍ර ගැටළු රාශියක් පිළිබඳ දැනුම ලැබීම.
- පර්යේෂකයන් සහභාගිවන්නේ නම් ඔවුනට ක්ෂේත්‍ර ගැටළු පිළිබඳ සෘජු අවබෝධයක් ලැබේ.
- ව්‍යාප්ති අංශයේ පවතින තාක්ෂණ දැනුම අලුත් කිරීම හා නිවැරදි කිරීමේ හැකියාව ඇත.
- ගොවීන්ට එකම ස්ථානයකදී බීජ, රෝපණ ද්‍රව්‍ය සහ කෘෂි ප්‍රකාශන ලබාගත හැකිවීම.

ප්‍රථම කෘෂි සායනය 2002/02/12 වන දින මහියංගන කලාපයේ සොරබොර කෘෂි උපදේශක කලාපයේ පවත්වන ලදී. එය "වී වගාවේ ක්ෂේත්‍ර ගැටළු හඳුනා ගැනීමේ සායනය" ලෙස හැඳින්විය. ව්‍යාප්ති හා පුහුණු අංශයේ අධ්‍යක්ෂතුමා ඇතුලුව ප්‍රධාන කාර්යාලයේ නිළධාරීන් රාශියක් සම්පත්දායකයින් ලෙස මෙම වැඩසටහනට සහභාගිවිය. එයට අමතරව තවත් එවැනි සායන 05 ක් අන්තර්පළාත් ප්‍රදේශ වල පවත්වන ලදී. මෙම වැඩසටහන් තුළින් ගොවීන් 237 ක් දෙනෙකු ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු වලට විසඳුම් ලබාගත්තෝය. අලුත්තරම බීජ සහතික කිරීමේ සේවයේ නිළධාරියෙකු, බීජ ගොවිපලේ නිලධාරීන්, මහියංගනය විවිධ සේවා සමුපකාර සමිතිය සහ පෞද්ගලික ආයතන කිහිපයක්ද මෙයට සහභාගි විය. මෙම සායන පැවැත්වීම සඳහා ගොවි කණ්ඩායම්වල සහයද ලැබුණි.

ප්‍රදේශයේ ප්‍රධාන බෝගය වී බැවින් එම බෝගය ආශ්‍රිතව බොහෝ ගැටළු ඉදිරිපත් විය. රෝග හා පළිබෝධ පාලනය, අලෙවි ගැටළු ඒ අතුරින් ප්‍රධාන තැනක් ගත්තේය. එයට අමතරව අතිරේක ආහාර බෝග වගාව, ගෙවතු සංවර්ධනය, නිවැරදි ලෙස කෘෂි රසායන භාවිතය, පැළෑටි පෝෂක හා පොහොර නිර්දේශ, බිත්තර වී ගොවිපලවල් ලියාපදිංචි කිරීම, බිත්තර වී අලෙවිය වැනි කරුණු යටතේ විසඳුම් ලබාදෙන ලදී. ගැටළු හඳුනා ගැනීමට ක්ෂේත්‍රයට යාමට අවශ්‍ය වූ විට ප්‍රවාහන පහසුකම් (මෝටර් සයිකල්) සපයන ලදී.

වෙනත් ආයතන රාශියක්ද මෙම සායන සඳහා සහයෝගය දැක්වූ බැවින් වී අලෙවි ප්‍රශ්න ඇතුළු බොහෝ ගැටළු රාශියක් සඳහා විසඳුම් ලබා දීමට හැකිවිය. උනන්දු කිරීමක් ලෙස ගැටළු ඉදිරිපත් කිරීමට පැමිණි ගොවිමහතුන්ට අංකයක් ලබා දී වැඩ සටහන අවසානයේ දී ලොතරැයියක් පවත්වා ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ලබා දුණි. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ප්‍රදේශයේ සියළුම කෘෂිකර්ම උපදේශකවරුන් ගේ සහය ලැබුණි.

එවැනි සායන 2002/02/14 හා 2002/03/07 දිනවල නාඋල, හඟුරන්කෙත ප්‍රදේශවලද පැවැත් වූ අතර ගන්නොරුව උද්‍යානබෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ නිළධාරීන් රාශියක්ද, මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් රැසක් ද සහභාගි විය. ගොවීන් විශාල සංඛ්‍යාවක් මෙම සායන වලට සහභාගි වී ඔවුන් ගේ ක්ෂේත්‍ර ගැටළු වලට විසඳුම් ලබාගන්නා ලදී.

*මූලාශ්‍රය: දිසානායක මිය, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති), මහනුවර අන්තර්පළාත් සහ ඒ. පාළමකුඹුර, පර්යේෂණ නිළධාරී, උද්‍යානබෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය*

# නව මාළු කෙසෙල් ප්‍රභේදයක්

කෙසෙල් ශ්‍රී ලංකාවේ වඩාත් ජනප්‍රිය හා වැඩි වශයෙන්ම වගාවෙන පළතුරු බෝගය වේ. ව්‍යාංජන (එළවළුවක්) ලෙසට වවන කෙසෙල් ප්‍රභේද වගා වපසරිය වශයෙන් සැලකූ කළ සුළු ප්‍රමාණයක් වුවද එය පහතරට ප්‍රදේශයේ වැඩි වශයෙන් (හෙක්ටයාර 13,000) වගාවෙන එළවළු බෝගයක් වේ. නොවෙනස් ඉල්ලුම නිසා නිශ්චිත වෙළෙඳපොලක් ද දක්නට ලැබේ. නිර්දේශිත මාළු කෙසෙල් වර්ග නොමැති බැවින් ගොවීන්ට ලැබෙන අස්වැන්න අඩු මට්ටමක පවතී මේ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2002 මැයි මාසයේ දී "පුලස්ති" හා "ප්‍රසාද්" නමින් මාළු කෙසෙල් ප්‍රභේද 2 ක් හඳුන්වාදෙන ලදී.

මෙම ප්‍රභේද දෙකම ශ්‍රී ලංකාවේ දැනට වගා වෙන මාළු කෙසෙල් දර්ශ වලට වඩා වැඩි අස්වැන්නක් ලබාදේ.

## පුලස්ති

කෙසෙල් වගාව පිළිබඳ අන්තර්ජාතික ආයතනයෙන් හඳුන්වා දුන් පුලස්ති ප්‍රභේදය දෙමුහුන් සහ චතුර්ගුණ (AABB) කෙසෙල් ප්‍රභේදයක් වේ. එය "මොන්දන්" කෙසෙල් ප්‍රභේදය වෙනුවට ආදේශ කළ හැක. එහි ව්‍යාජකඳ ශක්තිමත්ව පිහිටන නිසා අධික සුළං වලට ඔරොත්තුදෙන අතර, සුළං හානිය සාපේක්ෂව අඩුය. මෙහි මොරෙයියන් දැමීම අඩු බැවින් වැඩි පැළ ඝනත්ව වගා ක්‍රමයට ඉතා යෝග්‍ය වේ.

පැළ සිටුවා මාස 7-8 කදී පීදෙන අතර එයින් දින 90 ක දී මාළු කෙසෙල් සඳහා අස්වනු නෙලා ගත හැක. ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී වෛරස් රෝගී තත්ව දක්නට නොලැබුණි.

**වගුව 1. සම්ප්‍රදායික වගා ක්‍රමය යටතේ (හෙක්ටයාරයට පැළ 1100 ක්) පුලස්ති හා ප්‍රසාද් ප්‍රභේදවල අස්වැන්න ලබාදීම**

| ප්‍රභේදය | මවු වගාව | | 1වන නිරි වගාව | | 2වන නිරි වගාව | |
|---|---|---|---|---|---|---|
| | කැනක බර (කි.ග්‍රෑ.) | අස්වැන්න (mt/ha) | කැනක බර (කි.ග්‍රෑ.) | අස්වැන්න (mt/ha) | කැනක බර (කි.ග්‍රෑ.) | අස්වැන්න (mt/ha) |
| **අඟුණකොලපැලැස්ස** | | | | | | |
| පුලස්ති | 26.3 | 28.9 | 27.1 | 29.8 | 24.3 | 26.7 |
| ප්‍රසාද් | 13.5 | 14.9 | 14.2 | 15.6 | 15.0 | 16.5 |
| **මහඉලුප්පල්ලම** | | | | | | |
| ප්‍රසාද් | 13.2 | 14.5 | 14.5 | 15.9 | 15.3 | 16.8 |

**වගුව 2: විවිධ ස්ථානවල වැඩි පැළ ඝනත්වය යටතේ වගා කළ ප්‍රසාද් ප්‍රභේදයේ අස්වනු දත්ත (හෙක්ටයාරයට පැළ 3300)**

| ස්ථානය | කැනක බර (කි.ග්‍රෑ) | අස්වැන්න (mt/ha) |
|---|---|---|
| අඟුණකොළපැලැස්ස | 15.5 | 51.2 |
| බටඅත | 14.3 | 47.2 |
| ගාල්ල | 16.5 | 54.5 |
| ලුනුගම්වෙහෙර | 14.3 | 47.2 |
| හුංගම | 15.1 | 49.8 |

**වගුව: පුලස්ති හා ප්‍රසාද් ප්‍රභේද දෙකෙහි අමු කෙසෙල් ගෙඩිවල ගුණාත්ම පරාමිතික (ගන්නොරුව ආහාර පර්යේෂණ ඒකකය මගින් විශ්ලේෂණය කරන ලදී.)**

| ගුණාත්ම පරාමිතික | පුලස්ති | ප්‍රසාද් |
|---|---|---|
| ගෙඩියක බර (ග්‍රෑම්) | 126.8 | 212.2 |
| ගෙඩියක දිග (සෙ.මී.) | 16.4 | 17.4 |
| වටප්‍රමාණය (සෙ.මී.) | 18.6 | 17.9 |
| මාංශලයේ බර (ග්‍රෑම්) | 59.2 | 166.9 |
| මාංශලයේ වර්ණය | කහ සුදු | සුදු කාණ්ඩය බී |
| පොත්තේ වර්ණය | කහ කොළ | කහ කාණ්ඩය 147 ඩී |
| වයනය | තද | තද |
| උතුරන වතුරේ පිසීමට ගත වූ කාලය | | |
| පොත්ත සහිත ගෙඩි | මි. 18 ($85^0C$) | මි. 21 |
| පොත්ත සහිතව කැපූ පෙති | මි. 10 ($60 - 80^0C$) | - |

අර්ධ-කුරු (semi-dwarf) ආකාර ශාකය මීටර් 2.1 - 2.9 ක් පමණ උසට වර්ධනය වේ. ව්‍යාජ කඳ කොළ පැහැතිය. වර්ණක දක්නට නොලැබේ. පත්‍ර තලය මතුපිට අඳුරු තද කොළ පැහැයක් ගන්නා අතර යටි පැත්ත අඳුරු කොළ පැහැයක් ගනී. ඇවරියක ගෙඩි 17 කට වඩා වැඩියෙන් පිහිටන අතර ගෙඩියක් සෙ.මී. 16-20 ක් දිගුවේ.

පුලස්ති ප්‍රභේදය පතනමන පීඩා වලට හොඳින් ඔරොත්තුදෙන අතර, කළු සිගටෝකා රෝගයට ප්‍රතිරෝධී වේ. පාංශු සාරවත්භාවය ආන්තික තත්ව වලදී උවද හොඳ අස්වැන්නක් ලබා දේ. කැනෙහි තිබියදීම ඇවරි ලෙස අස්වනු නෙලාගත හැකි අතර කැන එලෙස සති 6 ක් පමණ තබාගත හැකිවේ.

**ප්‍රසාද්**

දේශීය දර්ශ අතුරින් තෝරාගත් ප්‍රසාද් ප්‍රභේදය ඉහළ අස්වැන්නක් (හෙක්ටයාරයට ටොන් 15 ක්) ලබා දෙන අළු කෙසෙල් ප්‍රභේදයකි. එය බොහෝ පාංශු හා දේශගුණ තත්ව වලට ඔරොත්තු දේ. එහි තිත්ත රසයක් නොමැති අතර හොඳ රසයකින් යුක්තය. පැළ සිටුවා මාස 9-91/2 කදී පීදෙන අතර එයින් දින 70-80 කදී අස්වනු නෙළාගත හැක. එය සාමාන්‍ය තත්ව යටතේ දින 6 ක් පමණත්, සවිවර පොලිතීන් වල අසුරා ශීතකරන තත්ව යටතේ දින 17 ක් පමණ කල්තබාගත හැකිය.

අළු කෙසෙල් වර්ග පළවන නිරි වගාවේ දී බොහෝ විට කෙසෙල් වඳ පීදීමට භාජනය වන නමුත් මෙම ප්‍රභේදය සම්ප්‍රදායික වගා ක්‍රමය යටතේ එවැනි තත්ව වලට භාජනය නොවුණි.

ප්‍රසාද් ප්‍රභේදයේ කොළ පැහැති ව්‍යාජ කඳ මීටර් 2.1-2.9 ක් පමණ උසට වැඩේ. මොරෙයියන් මවු ශාකයට ආසන්නයෙන් මතු වේ. පත්‍ර තලය මතුපිට අඳුරු කොළ පැහැයක් ගන්නා අතර යටි පස දිලිසෙන සුදු පැහැයක් ගනී. ගෙඩියක් සෙ.මී. 13-16 ක් පමණ දිග වන අතර වට ප්‍රමාණය සෙ.මී. 15 ක් පමණ වේ. අපරිනත ගෙඩිවල පොත්ත රිදී පැහැයක් ගනී.

මෙම ප්‍රභේදය ගොවි ක්ෂේත්‍ර රාශියක පරීක්ෂා කරන ලද අතර දැනට වගාකරන ප්‍රභේද වලට වඩා ගුණාත්මයෙන් වැඩි, ඉහළ අස්වැන්නක් ලබාදෙන බව ගොවීන් පිළිගන්නා ලදී. එමෙන්ම අනෙකුත් අළු කෙසෙල් වර්ගවලට වඩා ප්‍රසාද් ප්‍රභේදයේ ඇවරියක වැඩි ගෙඩි ගණනක් දක්නට ලැබේ. පරීක්ෂණයට සහභාගි වූ සියළුම පාරිභෝගිකයින් ප්‍රසාද් ප්‍රභේදයේ පිසින ලද කෙසෙල් හොඳ බව වාර්තා කරන ලදී. කෙසෙල්කැන් ආවරනය මගින් සැලකිය යුතු ලෙස අස්වැන්න වැඩිකර ගත හැකි අතර වියළි හා තෙත් කලාප යන තත්ව දෙකේදීම හොඳ වර්ධන තත්වයක් පෙන්වා ඇත.

**වගා පාලන ක්‍රම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෙසෙල් වගාව සඳහා නිර්දේශිත වගා ක්‍රම මෙම ප්‍රභේද දෙක සඳහාද භාවිතා කළ හැකි වේ.

*මූලාශ්‍රය: ආචාර්ය එස්. වීරසිංහ මිය, පර්යේෂණ නිළධාරිනි, මාශ හා තෙල් බෝග පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන ආයතනය, අඟුණකොලපැලැස්ස.*

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිතුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*සංස්කරණය*
**පී. වාසුදේවා**

*පරිවර්තනය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

**මුද්‍රිත ද්‍රව්‍යය**

**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නෝරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.